# නිර්මාණ Nirmana



## ඔබමය කුලවතා......!

### තාගෝර් රචනයක් ඇසුරෙනි

අවරින් හිරු බසී මඳනල දසත හමයි
රත්පැහැ වළා ගම්මානය එළිය කරයි
වෙල් යායෙන් එහා වදුලක සිරිය මවයි
සම්බුදු පියා වැඩ ඉන්නේ එතැන තමයි

දවසේ වැඩ කොටස නිම කර සවස් වෙලා
නාගෙන ගොපළු දරුවෙක් යයි නිවෙස් බලා
විඳ ගැනුමට සිතී ඔහු දම් රසය නොලා
පියවර නගයි බුදුහිමි ඇති තැනම බලා

අවසර සමිඳ නමදිමි ඔබ පා කමල
ඇසුමට කැමැත්තෙමි සම්බුදු දම් නිමල
කී විට මෙසේ දරුවා දක්වා කොමළ
වදහළ සේක මේ ලෙස බුදු හිමි විමල

මගෙ මේ දහම හොඳ කුලවත් අයට මිස
නොදෙසමි අනුන් හට විඳගත නොහැක රස
එබැවින් දරුව හමුවී මව්පියන් තොස
දැනගෙන එන්න ඔබෙ කුලයත් නියම ලෙස

දරුවා මව හමුව ඇසුවා කුලය ගැන
කඳුලැලි නගයි ඇය තම පුතු අතට ගෙන
කනගාටුයි කියන්නට මගෙ දිවිය ගැන
දුප්පත්කම නිසයි පුත මේ සියළු වින

තනිකර එක පියෙක් නුඹ හට සිටියෙ නැත
එබැවින් ඔබට නිසි කුලයක් නොමැත පුත
දරුවා යළිත් දැන් බුදුහිමි අසල ඇත
ඔහු පැවසීය මවගෙන් ඇසූ සියලු වත

නිසි ලෙස ඇත්ත කීවෙන් ගුණ දහම් වවා
ඔබමය කුලවතා වෙන නැහැ මෙලොව පවා
මේ ලෙස වදාරා බුදුහිමි සතුට දෙවා
සැනසූ සේක ඉමිහිරි දම් රසය පොවා

♦ විශ්‍රාමලත් විදුහල්පති
එස්. ජයසුන්දර
උඩුගම Sri Lanka

## මට සිතෙන හැටි !

අන් අය කී නොකී දේ ගැන නොසිතන්න
අන් අය කළ නොකළ දේ ගැන නොතැවෙන්න
ඔබ කී නොකී දේ ගැන සිහියට ගන්න
ඔබ කළ නොකළ දේ ගැන විමසිලි වන්න!

බුදුහිමි හා දහම ගැන සිහියට ගන්න
අන් සරණක් මෙලොව නැති බව දැනගන්න
වැලකී පස් පවෙන් තෙරුවන් නමදින්න
හැකි හැම විටම දෙලොවට පින් කරගන්න!

♦ ලුම්බිණී විතාන Langley UK

## මධුර්

පෙම්බර මිතුරි මා හද සෙනෙහස රැන්දූ
මිතුදම කිසි විටෙක නොසැලෙයි ලෙස බැන්දූ
ගතවූ දෙදසකය වූ සොයුරිය බන්දූ
අද හද රිදෙයි සිහිකර සැටි මරු කැන්දූ

මධුරය සැම විටම මට ඔබ හමුවූ වෙලේ
අසිරිය දිවියෙ දුටුවෙමු මිතුදමෙහි බලේ
හදිසියෙ රථය ගැටිලා ගත බිඳුණ කලේ
බැරුවිය ඉවසන්න දුටුවිට ගිලන් හලේ

කලකට අසනීප ගත හා විසූ වාය
ඒ පිළිබඳව තොරතුරු නිති ඇසූ වාය
එනමුත් නුවණැසින් ලෙඩ දෙස බැලූ වාය
දිවියේ සැම බරම නොපැහැර දැරූ වාය

## අවනඩුව

රෝස මලේ නටුවෙ කටු
වන බමරෝ ඔහොම හිටු
පැටලුණි දෝ කටුවෙ තටු
දිනක ගොසින් මගක පටු

ගුමු ගුමු දී බමන මතේ
සැරිසරමින් සිතූ මතේ
මල්ගොමුවෙන් මලක වතේ
සිඹ සිඹ යයි විලස රතේ

හිමිදිරියේ විසුල පැසේ
ළහිරු සෙනේ බිඳ සිතුසේ
යන්නෙද නුඹ විගස මෙසේ
එමල සෙනෙහෙ හද බැඳිසේ

බී රොන් මත්වී සතොසේ
ලෝ ජයගත් රජෙකු ලෙසේ
තැනතැන ජය පතන ගොසේ
කිම නුඹ දැන් කියන දොසේ

" නෙක අහනුන් ළඟ මිතුරේ
මගෙ හද නිරතුරු වැතිරේ
ගුමු ගුමු දී ගොමු අතරේ
සිපගමි මල් කෙමි මිහිරේ "

" අයාලයේ පියඹ යමී
නිශාන්තයේ නැවත එමී
නටුව නොවෙයි මල සිඹිමී
මම ළමයෝ පැණි උරමී "

♦ මාලපල්ලේ
කුමුදු රොහාන්
අමරසිංහ
Edmonton - London

ලංකාවේ ගැමි දරුවෙකුගේ සිතැඟි කියාපාන මෙම කවි පංතිය 50 දශකයේදී ලියන ලද්දේ දක්ෂ ලේඛකයෙකු, කවියෙකු හා ගීත රචකයෙකුද වූ අභාවප්‍රාප්ත මානවසිංහ මහතා විසිනි.

## මං හිටියානම් !

### ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විසිනි

බුදුහාමුදුරුවන් ඉස්සර වඩින කොට
මං හිටියනම් යන විට කැළයට දරට
වනමල් නෙලා අතුරා සිරි පතුල් යට
වැඳ වැඳ ඉන්නවා නොගොසින් වරුව කට

කාටත් හොරෙන් ගොඩ අරගෙන කැටය මගේ
සිවුරක් ගෙනැත් දෙනවා කහ අත්ත වගේ
එතකොට බලත හැකි පොරවා වඩින රගේ
කිනිහිරි ගසක මල් සෙළවෙන වැනි සුළඟේ

පන් උගුලන් ඇවිත් සායම් පොවා ගෙන
තුන් ඉරි රටාවෙන් පැදුරක් වියා ගෙන
අම්මට තාත්තට අතගස්සවා ගෙන
දෙනවා ගොසින් සැතපෙන්නට එළා ගෙන

රාහුල පුංචි හාමුදුරුවො වඩින කොට
අල්ලා සිවුරු කොණකින් ගෙනැවිත් ළඟට
කිරිබත් උයාලා ඇල් හාලෙන් රසට
ටික ටික වළඳවනවා ගෙනැවිත් ළඟට

බුදුහාමුදුරුවන් හට බැණ වදින විට
මොකටද ඉතින් ඉන්නට බැරිවුණා මට
අම්මල මොනව කීවත් මොළවලා මිට
දෙනවා චිංචිමානවිකාවගෙ කටට

සම්මතයට ඇවිදින් වාදෙට පැන්න
සැක්කරයා මොටද ආවේ ඔර වන්න
දිව ඇද විරිත්තා පණ්ඩිතකම යන්න
මල්ලියි මමයි හිටියම ඇති නිය වන්න

ගල් පෙරළපු දවසෙ ගිජිකුළු පව්වෙ සිට
මං හිටිය නම් ශත පණහක් දී අතට
රාබොන අපේ ලොකුමාමා පිටත් කොට
දැනමුතුකමක් කරනව දෙව්දත් තෙරට

මෙය මතකයෙන් ලියා එවන ලද්දේ
♦ එස්. කංකානම්ගේ
London SE 5

දහමට යටවේය ලොව ඇති සියළු දෙය
සිත කළඹාගැන්ම ඉන් නුසුදුසු වේය
එනමුදු දැනේ හද තැවෙනා විලා සය
සැනසුම බුදුවදන් පවසන නිවා නය

ලෙඩ යහනෙදි වුවද රස කවි ගෙතූ මියුරු
අගයෙමි ඔබේ සිත ලෝදම දුටු අයුරු
රුවන් කතකි අපතර සැමගේ මිතුරු
සැමකල් පතමි! සැප ඔබහට නිවන තුරු

*(මේ පැදිපෙළ නොබෝදා අප අතැර ගිය හිතවතිය මධුරි අබේවික්‍රම මහත්මිය වෙනුවෙනි.)*

♦ වෛද්‍ය ශ්‍රියා ගුණසේකර
London



## උපන්දිනය දා!

මව්පියන්ට අසිරිමත්ය දරු ඉපදුණු දා
පුංචි අයට රජ කිරුළකි උපන් දිනය දා
හාදු වැස්සකින් තෙමේවි පෙම්වතුන් එදා
නොවැදගත්ය විවාහයෙන් පසුව එය සදා

මැදි වයසට පැමිනුණ කල හිත ගැස්සෙන දා
වයසට ගිය පසු ලා සිත් බියවද්දන දා
හැම ආශිංසන ගෙන එති උපන් දිනය දා
හැකි හැම දෙන හැකි අයුරින් සමරණව එදා

කල්ප කාලයක් දස පාරමී දම් පුරා
දුර්ලභ උපතක් අරගෙන කෙලෙස් බැමි ඉරා
බුදු වූවද නැත කිසි දවසක මෙය සමරා
කවුරුද අපි සමරණ මෙය වසරින් වසරා

♦ ප්‍රදීපා වික්‍රමසිංහ
London SW19

## කමිසය

ඉරුණු කමිසය මසමින්
සිනාසෙයි මා බිරිඳ
සිහිවීය මට
ඒ කමිසය තෑගි දුන් දා
මා ඇය සිපගත් හැටි!

Darren -London

## හිමි අහිමි

ඔබ මගේ හිමි බව සැබවි
එහෙත් ඔබ කිසි දිනෙක
මට හිමි නොවුණි

මා ඔබට හිමි බව ද සැබවි
එහෙත් කිසි දා මා
ඔබට හිමි නොවුණි

රන් හුයෙන් පමණක්ම
දැහිලිද බැඳිණි
අප දෙසිත කිසිදාක
අප වෙතට නොබැඳුණි
දෙදරුවන් ලදිමි,
අද මහමෙරක බර දරමි
එහෙත් එක වහල යට
දෙලොවකම තනිවීමි

අප අපට හිමි නොවුනෙ
පෙර පවින් යයි සිතමි
මෙත් සිතින් සෙනෙහසින්
හෙටත් ඔබ ළඟ හිඳිමි
නෙලාගත්තත් සුවඳ
බලන්නට මට අහිමි
මලකි ඔබ
මගෙ වසන්තයම
මට කළ අහිමි

♦ කිත්මිණි ජයසිංහ
Essex UK

## පිය සැමරුම් !

සැමගෙන් වෙන්ව වාසය
මේ දුරස් තර
නැගඑන්නේය පැනයන්
වී පරස් පර
බෙහෙවින් වෙහෙස
දරමින් තැත නිරන් තර
කරනෙමි පිය සැමරුමක්
මම හැඟුම් බර !

සන්ධ්‍යා කුමාරගේ
France

## from Salalihini Sandeshaya of Ven. Thotagamuve Sri Rahula Thera

### පූජ්‍ය තොටගමුවේ ශ්‍රී රාහුල මහා නාහිමියන්ගේ සම්භාව්‍ය කාව්‍ය සංග්‍රහය

## සැළලිහිණි සංදේශයෙන්

පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්
පරව තඹර පෙති ගිලි දිය තලා පිටින්
තරව සිහි ඇතිව පරතෙරට යන අටින්
කරව පියාසර සකි කොන්තගම් තොටින්

රාත්‍රියේ සඳකිරණ පොරවාගෙන පිපුණු කුමුදුමල් පරවී ජලයේ ගිලී පාවෙන්නේය. ඒ තඹරු පෙති සහිත දියතලා මතින් මිතුර! ඔබ, කොන්තගම් තොටින් ඉවතට යන දැඩි අදහසින් යුතුව පියාසර කරන්න.

Perava sanda kirana pipi kumudu mal watin
Parava thambara pethi gili diya thala pitin
Tharava sihi ethiwa paratherata yana atin
Karava piyasara saki Konthagam thotin

Carrying full-blossomed Kumudu flowers, clad in the beams of the moon; covering the surface of the water with the faded petals of the water-lily, O friend, if it is thy desire to cross the ferry at Kontagama, fly with a firm determination.



## පෙම් හපය

සඳ කට ඇර කිරණ වමනය කළ රැයක
ඔබ කට ඇර කියූ ඒ උල් වචන ටික
සුවචන හදට ඇන ඇන හිනැහෙයි වරෙක
මධුවිත සමග වමනය කරනෙමි ඒ දුක


ප්‍රේමය ගිලන් වී හොටුහූරන කහින
තෙමෙන පෙඟෙන අවමන් වැස්සෙහි වහින
බිත්තර කටු ලෙසින් පොඩි වී යයි සිහින
සිදී දිය ගැහෙයි සිතිවිලි මසු අහින

දැස් දවයි ඉහි කඳුලැල් දැක දැකම
මිතුරු බස් ද කොනහයි සිත සියුම් සම
කම්මුල් පහර වැනි මිමිණුම් හැම තැනම
හාදුවක් වගෙයි එනමුත් ඔබෙ බැණුම

මා ගැන ඔබේ කන හොත් පිහිතල බොරුව
බින්දෙන් අපේ පෙම කැටයම් වීදුරුව
මිරිස් කුඩක් මෙන් නැහැපුඩු තුළ හැලුව
මතකයෙ යවට සුණු ගිනිලයි හිත පපුව

බුලත් විටක් ලෙස හප හප කෙළ ගහන
මගෙ පෙම සොඳුරු හපකොට ඔබ විසි කරන
දිනයක දළඹුවෙක් හෝ ඉනු ඇත එතැන
හපය උරා සමනළ තටු ලැබ සරන

♦ ලක්ශාන්ත අතුකෝරළ Sri Lanka



## ඔබේ නුවන් !

නුවන් යොමා නුවන් තුළින් කතාකරන නුවන්
නුවන් තෙමා නුවන් තුළින් කඳුළු සදන නුවන්
නුවන් සලා නුවන් තුළින් සිනා මවන නුවන්
නුවන් තුළින් මා දුටුවේ ඔබෙ පෙම්බර නුවන්

♦ සුනිල් පෙරේරා Skegness, Linconshire UK